සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

12715

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2000 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2000 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2000

**ශුද්ධ ගණිතය I**
**தூய கணிதம் I**
**Pure Mathematics I**

| 05 | |
|---|---|
| S | I |

පැ. තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

ප්‍රශ්න හතකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (අ) $A, B$ යනු $S$ සර්වත්‍ර කුලකයක උපකුලක යැයි සිතමු. සුපුරුදු අංකනයෙන්,

(i) $(A \cap B) \cup (A' \cap B') \cup (A' \cap B) \cup (A \cap B') = S$ බව ද

(ii) $A = \phi$ ම නම් පමණක් $(A \cap B') \cup (A' \cap B) = B$ බව ද

සාධනය කරන්න.

ඉහත ප්‍රතිඵල සාධනයේ දී, ඔබ උපයෝගී කරගනු ලබන කුලක වීජයේ නියම ප්‍රකාශ කළ යුතු යි.

(ආ) $f(x) = \sin^{-1}\left(\dfrac{x-3}{2}\right)$ සහ $g(x) = \log_{10}(4-x)$ යැයි සිතමු ; මෙහි $x$ තාත්ත්වික වේ.

(i) $f$ හි ත් $g$ හි ත් වසම සොයා, ඒ නයින් $f+g$ හි වසම සොයන්න.

(ii) $f \circ g(-96)$ හි අගය කුමක් ද?

(ඇ) $f: \mathbb{Z} \to \mathbb{Z}$ යන්න, $f(x) = 3x + n - nx$ යන්නෙන් අර්ථ දක්වේ යැයි සිතමු ; මෙහි $n$ යනු දී ඇති නිඛිලයකි.

(i) $f$ එකට එක වීම

(ii) $f$ මතට වීම

සඳහා, $n$ හි අගයයන් සොයන්න.

තව ද, $f$ හි ප්‍රතිලෝම ශ්‍රිතය, එය පවතින විට සොයන්න.

2. (අ) $(x+y)^3(x-y) + (y+z)^3(y-z) + (z+x)^3(z-x)$ හි සාධක සොයන්න.

(ආ) $\alpha$ සහ $\beta$ යනු $x^2 - bx + c = 0$ සමීකරණයේ තාත්ත්වික මූල වේ. තව ද $\alpha \geq \beta$ වේ.

$\alpha - \beta = \sqrt{b^2 - 4c}$ බව පෙන්වන්න.

$(\alpha+1)$ සහ $(\beta+2)$ යනු $2x^2 - qx + r = 0$ සමීකරණයේ මූල නම්, $b$ සහ $c$ ඇසුරෙන් $q$ සහ $r$ සොයන්න.

$\alpha = \beta$ විට, $q^2 = 4(2r+1)$ බව පෙන්වන්න.

(ඇ) $a, b, c$ යනු $(a+1)(b+1)(c+1) \neq 0$ පරිදි වූ තාත්ත්වික නියත වන අතර,

$$x + y = az + xyz$$
$$y + z = bx + xyz$$
$$z + x = cy + xyz$$

වෙයි.

$(a+1)z = (b+1)x = (c+1)y$ බව පෙන්වන්න.

ඒ නයින්, හෝ අන් ක්‍රමයකින් හෝ, $a, b, c$ සියල්ල ම ධන ද, $bc < 1$ ද, වන අවස්ථාවේ දී $x, y$ සහ $z$ සඳහා ඉහත සමීකරණ තුන විසඳන්න.

[ අනෙක් පිට බලන්න.

3. (අ) $\left|\frac{2x-1}{x+1}-2\right|<1$ අසමානතාව විසඳන්න.

(ආ) $n$ ධන නිඛිලයක් විට, $(1+x)^n$ හි ප්‍රසාරණය, $x$ හි බලවල ආරෝහණ පටිපාටියට සැකසූ ශ්‍රේණියක් ලෙස ලියන්න.

(i) $(1+x)^{2n}$ හි සහ $(1+x)^n(1+x)^n$ හි ප්‍රසාරණ සැලකීමෙන් හෝ අන් ක්‍රමයකින් හෝ,

$$\sum_{r=0}^{n}\left({}^{n}C_{r}\right)^{2}={}^{2n}C_{n}$$

බව පෙන්වන්න.

(ii) $\left(1-x^2\right)^n$ හි ප්‍රසාරණය භාවිත කිරීමෙන්, $n$ ඔත්තේ විට, $\sum_{r=0}^{n}(-1)^r\left({}^{n}C_{r}\right)^2$ සොයන්න.

[${}^{n}C_{r}$ ට සුපුරුදු අර්ථය ඇත ]

4. (අ) 0, 1, 2, 4, 7, 8 සංඛ්‍යාංක යොදා ගනිමින්, පුනරාවර්ත සංඛ්‍යාංක නොමැති වූ ද එක් එක් සංඛ්‍යාව 6000 ට වැඩි වූ ද එකිනෙකට වෙනස් සංඛ්‍යා කොපමණ සෑදිය හැකි ද? (සාමාන්‍ය සම්මුතියට අනුව, සංඛ්‍යාවක ආරම්භක සංඛ්‍යාංකය 0 නොවේ.)

(ආ) එක්තරා පංතියක පිරිමි ළමයින් 7 ක් ද ගැහැනු ළමයින් 6 ක් ද සිටී. අඩුම වශයෙන් පිරිමි ළමයින් 3 දෙනෙකුවත් සිටින්නා වූ හරියටම 5 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් සෑදිය හැකි ආකාර ගණන කවරේ ද?

[එක් එක් අවස්ථාවේ දී, ක්‍රමය පැහැදිලිව දක්විය යුතු ය.]

5. (අ) ගණිත අභ්‍යුහනය පිළිබඳ මූලධර්මය භාවිතයෙන්, ඕනෑම $n$ ධන නිඛිලයක් සඳහා,

$$1^2-2^2+3^2+\ldots+(-1)^{n+1}n^2=(-1)^{n+1}\frac{n(n+1)}{2}$$

බව සාධනය කරන්න.

(ආ) අපරිමිත ශ්‍රේණියක $r$ වැනි පදය වන $u_r$ යන්න $\frac{1}{r^2(r+2)(r+4)^2}$ වේ.

සෑම $r$ ධන නිඛිලයක් සඳහා $u_r=f(r)-f(r+2)$ වන පරිදි වූ $f$ ශ්‍රිතයක් සොයන්න.

$$\sum_{r=1}^{n}\left[f(r)-f(r+2)\right]=\left[f(1)+f(2)\right]-\left[f(n+1)+f(n+2)\right]$$

බව පෙන්වන්න.

$\sum u_r$ ශ්‍රේණිය අභිසාරී බව පෙන්වා, එහි ඓක්‍යය සොයන්න.

6. (අ) $x \neq 1,\ -3,\ \frac{-5}{3}$ සඳහා,

$$f(x)=\frac{1}{|x-1|}\left(\frac{A}{x+3}-\frac{B}{3x+5}\right)$$

යැයි සිතමු ; මෙහි $A$ සහ $B$ නියත වේ.

$\lim_{x\to 1-} f(x) = -\frac{1}{32}$ වන පරිදි වූ $A$ සහ $B$ හි අගයයන් සොයන්න.

$A$ සහ $B$ හි ඉහත අගයයන් සඳහා, $\lim_{x\to 1+} f(x)$ නිර්ණය කරන්න.

$\lim_{x\to 1} f(x)$ පවතී ද?

(ආ) $g:\mathbb{R}\to\mathbb{R}$ ශ්‍රිතය,

$$g(x)=\begin{cases}(x-1)^2 & ;\ x<1\\ \frac{1}{x}-1 & ;\ 1\le x<2\\ (x+1)^2 & ;\ x\ge 2\end{cases}$$

යන්නෙන් අර්ථ දක්වනු ලැබේ.

$x=1$ දී සහ $x=2$ දී $g$ සන්තතික දැයි නිර්ණය කරන්න.

7. (අ) $x\ln y - y\ln x = 1$ නම් $x=1$ විට $\frac{dy}{dx}$ සොයන්න.

(ආ) $y = xe^{-\frac{1}{x}}$ නම් $x^3\frac{d^2y}{dx^2} - x\frac{dy}{dx} + y = 0$ බව පෙන්වන්න.

(ඇ) $f:\mathbb{R}\to\mathbb{R}$ ශ්‍රිතය $f(x)=\sqrt{1+\cos x}$ යන්නෙන් අර්ථ දක්වනු ලැබේ. $x=\pi$ හි දී $f$ හි අවකලනතාව පරීක්ෂා කරන්න.

$g(x)=(x-\pi)f(x)$ ශ්‍රිතය $x=\pi$ හිදී අවකලනය ද නැත් ද යන්න ද නිර්ණය කරන්න.

[ අනෙක් පිට බලන්න.

8. $f(x) = \dfrac{3-4x}{x^2+1}$, $x \in \mathbb{R}$ යැයි සිතමු.

(i) ඛණ්ඩාංක අක්ෂ ඡේදනය කරන ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ද

(ii) උපරිම හා අවම ලක්ෂ්‍යවල (ඒවා තිබේ නම්) ඛණ්ඩාංක ද

(iii) $|x|$ හි විශාල අගයයන් සඳහා හැසිරීම ද

ගෙනහැර දක්වමින් $y = f(x)$ වක්‍රයේ දළ රූප සටහනක් අඳින්න.

$f$ හි ප්‍රස්තාරය උපයෝගී කර ගනිමින්, $y = \dfrac{1}{f(x)}$ වක්‍රයේ දළ රූප සටහනක් ද අඳින්න.

ඒ නයින්, හෝ අන් ක්‍රමයකින් හෝ, $e^x f(x) = 1$ සමීකරණයට අඩුම වශයෙන් තාත්ත්වික විසඳුම් දෙකක් වත් තිබෙන බව පෙන්වන්න.

9. $\displaystyle\int \frac{1}{3} x \sin\left(\frac{\pi}{2}x\right) dx$ සහ $\displaystyle\int \frac{10(x-4)}{x^2+1}\, dx$ සොයන්න.

$f : [0, 7] \to \mathbb{R}$ ශ්‍රිතය

$$f(x) = \begin{cases} \dfrac{1}{3} x \sin\left(\dfrac{\pi}{2}x\right) & ; \ 0 \le x \le 3 \\[2ex] \dfrac{10(x-4)}{x^2+1} & ; \ 3 < x \le 7 \end{cases}$$

යන්නෙන් අර්ථ දක්වනු ලැබේ.

$\displaystyle\int_0^7 f(x)\, dx$ සහ $\displaystyle\int_0^7 |f(x)|\, dx$ අගයන්න.

$0 \le x \le 7$ සඳහා, $y = f(x)$ සහ $y = |f(x)|$ ප්‍රස්තාර අතර වර්ගඵලය අපෝහනය කරන්න.

10. (අ) $z = y - x$ ආදේශය භාවිත කිරීමෙන් හෝ අන් ක්‍රමයකින් හෝ, $x = 0$ විට $y = 0$ යැයි දී ඇත්නම්,

$$\frac{dy}{dx} = \frac{x - y + 1}{2x - 2y + 3}$$

අවකල සමීකරණය විසඳන්න.

(ආ) $\lambda$ පරාමිතියක් විට, $y + 3 = \dfrac{\lambda}{x^2 - 4}$ වක්‍ර කුලය මගින් සපුරාලන අවකල සමීකරණයක් ලබාගන්න.

තව ද, ඉහත වක්‍ර කුලයේ ප්‍රලම්බ පරාවක්‍රයන් හි සමීකරණය ලබාගන්න